www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉන්දියානු මාධ්‍ය සෝනියා ගාන්ධිට ප්‍රශංසා කිරීම පිටුපසින්

**Behind the Indian press's adulation of Sonia Gandhi**

**සරත් කුමාර හා කීත් ජෝන්ස් විසිනි**
**2006 අප්‍රේල් 17**

තමන්ගේ ඉල්ලා අස් වීම නිසා ඇති වන අතුරු මැතිවරනයේ දී යලි තේරී පත් වීම පමනක් ම ඉලක්ක කර ගනිමින් පසු ගිය මාසයේ කොන්ග්‍රස් පක්ෂ නායිකා සෝනියා ගාන්ධි තම පාර්ලිමේන්තු අසුනින් ඉල්ලා අස් වීම නිවේදනය කල විට ඉන්දියාවේ මාධ්‍ය සංගත ඇය උසස් ම දේශපාලන මූලෝපායඥවරියක බව එකහෙලා ප්‍රකාශ කලේ ය. කතාව ගිය ආකාරයට, නිලයේ අතිරේක වරප්‍රසාදවලට ගිජු නොවූ දේශපාලනඥවරියක ලෙස තමා කෙරේ ඇති විශ්වාසය නැවත වතාවක් තහවුරු කර ගන්නා ගමන් ගාන්ධි ඇයගේ දේශපාලනික විරුද්ධවාදීන් ව්‍යාකුලත්වයට පත් කොට තිබුනි.

මේ සඳහා නියම සාදෘශ්‍යය වන්නේ හින්දුස්ථාන් ටයිම්ස් පුවත්පතේ ප්‍රතික්‍රියාව යි. ''සෝනියා ගාන්ධි කැපී පෙනෙන දේශපාලනඥවරියකි'' යන සිරස්තලය යටතේ පල කල කතුවැකියක ලෝක් සභාවෙන් ගාන්ධි තාවකාලිකව ඉවත් වීම ''ප්‍රබල පහරක්'' ලෙස හැඳින්වුනි.

කොන්ග්‍රසය තම ප්‍රතිමල්ලව සමාජවාදී පක්ෂයට එරෙහිව ඊනියා ලාභප්‍රයෝජන-සඳහා-නිලතල යන කරුන මත පදනම්ව දියත් කල උද්ඝෝෂනය දරුනු ලෙස වැරදී ගිය තතු තුල ඇත්ත වසයෙන් ම ගාන්ධිගේ ඉල්ලා අස් වීම අවශ්‍යතාවක් බවට පත් විය. ගාන්ධි-නේරු කොන්ග්‍රස් පාලක පෙලපතේ වත්මන් ප්‍රධානියා මෙන් ම කොන්ග්‍රස්-නීත එක්සත් ප්‍රගතිශීලී සන්ධාන ආන්ඩුවේ සිහසුන පසුපස සිටින බලය ද වන තැනැත්තී ක්ෂනිකව ම ජනාධිපති නියෝගයක් මගින් තම ලෝක් සභා අසුනින් ඉවත් කරනු ලැබීමේ අනතුරට මුහුන දුන්නා ය. එය එසේ සිදු වූයේ නම් වත්මන් පාර්ලිමේන්තුව විසුරුවන තෙක් - එනම් මීලඟ සමස්ත ඉන්දියානු මැතිවරනය පැවැත්වෙන තෙක් - ගාන්ධි යලි පත් වීමෙන් නීත්‍යානුකූලව වැලැක්වෙනු ඇත.

යම් නිලයක්, ලාභප්‍රයෝජන-සඳහා-නිලතල ලෙස පාර්ලිමේන්තුවෙන් නම් කොට තහනම් කරන ලද්දා වූ නිලතලවලට නිශ්චිතව ම පිටස්තරව තිබුන ද ඉන්දියානු පාර්ලිමේන්තු සභිකයන් මධ්‍යම හෝ ප්‍රාන්ත ආන්ඩු මගින් පත් කරන ලද කවර හෝ නිල තනතුරක් දැරීමට එරෙහිව ව්‍යවස්ථානුකූල තහනමක් ගෙන ආ යුතු යැයි මුලින් ම සෝෂා කලේ ගාන්ධිගේ නොවක් පිටුබලය සහිත කොන්ග්‍රසය යි.

සමාජවාදී පක්ෂ දේශපාලනඥවරියක මෙන් ම නිලියක ද වන ජයා බහදූරි ඉන්දියානු පාර්ලිමේන්තුවේ ඉහල මන්ත්‍රී මන්ඩලය වන රාජ්‍ය සභාවේ මන්ත්‍රී ධුරයක් දරන අතර ම උත්තර ප්‍රදේශ් සිනමා ප්‍රවර්ධන මන්ඩලයේ සභාපති තනතුර ද දැරීම මගින් ඇය ලාභ-ප්‍රයෝජන-සඳහා නිලතල ලබා ගැනීම තහනම් කෙරෙන නීතිය උල්ලංඝනය කරමින් සිටී යැයි කොන්ග්‍රසය චෝදනා කර තිබුනි.

කොන්ග්‍රසයේ පැමිනිල්ල හා මැතිවරන කොමිසමේ නිර්දේශය මත ක්‍රියා කල ජනාධිපති අබ්දුල් කසාම්, බහදූරි පාර්ලිමේන්තුව අවසර දී නොමැති ප්‍රාන්ත ආන්ඩු පත්වීමක් දරන බව සොයා ගෙන ඇය රාජ්‍ය සභා අසුනෙන් ඉවත් කලේ ය. (හින්දු අධිපතිවාදී භාරතීය ජනතා පක්ෂයට හෙවත් බීජේපීයට එරෙහිව කොන්ග්‍රසය හා සමාජවාදී පක්ෂය මතුපිටින් සහයෝගී වුව ද එම පක්ෂ දෙක දීර්ඝ කාලයක් පුරා දැඩි හා නිමක් නොපෙනෙන බල අරගලයක නිරතව සිටී. මේ වසර මුල දී සමාජවාදී පක්ෂය, තම දුරකථන සංවාදවලට රහසේ සවන් දීම පිලිබඳව මධ්‍යම රජයට චෝදනා කලා ය.)

බහදූරි සාර්ථක ලෙස ඉවත් කිරීම සඳහා කොන්ග්‍රසය කටයුතු කිරීම කෙරෙහි ප්‍රතිචාර දැක්වූ බිජේපිය ප්‍රධාන විපක්ෂය, ගාන්ධි පාර්ලිමේන්තු මන්ත්‍රී තනතුරක් ද දරමින්, 2004 දී බලයට පත් කොන්ග්‍රස්-නීත ආන්ඩුව සිය එක්සත් ප්‍රගතිශීලී සන්ධානයේ පොදු අවම වැඩ පිලිවෙල ක්‍රියාවට දැමීම සඳහා අලුතෙන් ඇති කරන ලද ජාතික උපදේශක කවුන්සිලයේ සභාපති තනතුර ද දැරීම මගින් ඇය මත් ලාභප්‍රයෝජන-සඳහා-නිලතල දැරීම වලක්වන නීතිය උල්ලංඝනය කරන බවට චෝදනා කලා ය.

ගාන්ධි නෛතික වසයෙන් ගැටලු සහගත ක්ෂේත්‍රයකට පිවිස ඇතැයි අවබෝධ කර ගත්

කොන්ග්‍රසය විපක්ෂයේ උද්ඝෝෂනයට ප්‍රතිචාර දැක්වූයේ ගාන්ධිට අවශ්‍ය පාර්ලිමේන්තු මුක්තිය ලබා දීමට නව නීතියක් සම්මත කර ගැනීමට හැකි වන පරිදි පාර්ලිමේන්තුව කල් දැමීමට උත්සාහ දැරීමෙනි. නමුත් ගාන්ධිගේ පෞද්ගලික අවශ්‍යතාවලට සේවය කිරීම සඳහා පාර්ලිමේන්තු න්‍යාය පත්‍රය පැහැර ගැනීමට කොන්ග්‍රසය කටයුතු කරන්නේ යැයි බීජේපීය කොන්ග්‍රසයට චෝදනා කල අතර, කොන්ග්‍රසයේ උත්සාහයට සහයෝගය දීම බීජේපීය හා එහි ජාතික ප්‍රජාතන්ත්‍රවාදී සන්ධාන සගයෝ ද සමාජවාදී පක්ෂය සහ වාමාංශික පෙරමුන ද ප්‍රතික්ෂේප කලහ.

එවිට ගාන්ධි හා ඇගේ උපදේශකයන් ඉල්ලා අස් වීමේ කුටෝපාය ක්‍රියාවට දැමුවේ එවිට තව දුරටත් ඇය ලෝක් සභා ආසනයක් නොදරන නිසා එමගින් ලාභප්‍රයෝජන-සඳහා-නිලතල පිලිබඳ ගැටලුව යටපත් කරමිනි.

පූර්ව බීජේප-නීත ආන්ඩුව මගින් පත් කරන ලද ජනාධිපතිවරයෙකු විසින් ගාන්ධිගේ ඉරනම තීරනය කිරීමට ඉඩ දීමට ඉන්දියානු වත්මන් සභාග ආන්ඩුවේ ප්‍රමුඛ පාර්ශ්වකරුවාට අවශ්‍ය නො වී ය.

ලාභප්‍රයෝජන-සඳහා-නිලතල ලබා ගැනීම වලක්වන නීතිය පාර්ලිමේන්තු සභිකයින්ට වැඩ අඩු සහ පඩි වැඩි රැකියා ලබා දීම මගින් ඔවුන්ට බලපෑම් කරනු ලැබීම අවශ්‍ය ය යන්න ඉන්දියානු දේශපාලන කව සාමාන්‍යයෙන් පිලිගනී. මෙම නීතිය උල්ලංඝනය කරමින් ආන්ඩු පක්ෂයේ මෙන් ම විපක්ෂයේ ද තවත් සභිකයන් 60 දෙනෙකු ම මධ්‍යම හා ප්‍රාන්ත ආන්ඩු තනතුරු දරන බැව් ප්‍රසිද්ධ ය.

දේශපාලන ගිනි කෙලි තිබියේ වුව ද, මෙම සිද්ධිය මගින් එක්සත් ප්‍රගතිශීලී සන්ධානයේ හෝ ගාන්ධිගේ අනාගතය කෙරෙහි බලගතු බලපෑමක් ඇති කිරීමේ ඉඩ අල්ප ය.

එසේ වුව ද ලාභප්‍රයෝජන-සඳහා-නිලතල ලබා ගැනීමේ කරුන මතින් ප්‍රතිලාභ ලැබීමේ කොන්ග්‍රසයේ උත්සාහය ද ගාන්ධිගේ ඉල්ලා අස් වීමට මාධ්‍ය දක්වන ප්‍රතිචාරය ද වැඩි දුර විස්තර කථනයක් ලැබීමට සුදුසු වේ.

ප්‍රථමයෙන් ද ප්‍රමුඛව ද, ගාන්ධි වටා මාධ්‍ය කල අත්‍යසාමාන්‍ය රැලි වීම හා ඇගේ නායකත්වය ගැතිකමින් උත්කර්ෂයට නැංවීම මගින් පෙන්නුම් කෙරෙන්නේ ඉන්දියානු පාලක පන්තියේ බලගතු කොටස් තමන්ගේ නව-ලිබරල් න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යාමට යොදා ගත හැකි හොඳ ම වාහකය ලෙස එක්සත් ප්‍රගතිශීලී සන්ධාන තන්ත්‍රය - මෙය බලය දරා සිටින්නේ වාම පෙරමුන ලබා දෙන පාර්ලිමේන්තුමය සහයෝගය නිසා පමනි - දැක ගන්නා බව යි.

පූර්ව බීජේපී තන්ත්‍රයේ ආර්ථික ප්‍රතිව්‍යුහකරනයන් මගින් නිෂ්පන්න කරන ලද කාලකන්නි භාවයට හා ආර්ථික අනාරක්ෂිත භාවයට එරෙහි මහජන කෝපාග්නියේ රැල්ලක් මතින් 2004 මැයි මාසයේ දී බලයට පැමිනි තැන් පටන් එක්සත් ප්‍රගතිශීලී සන්ධානය, නො වැලැක්විය හැකි මහජන විරෝධය මෙල්ල කිරීමටත් පීලි පැන්නවීමටත් ස්ටැලින්වාදීන් නායකත්වය දෙන වාම පෙරමුන ප්‍රයෝජනයට ගන්නා අතර ම, ප්‍රාග්ධනය මත ඇති සකල පාලන සීමාවන් අහෝසි කිරීම වේගවත් කොට ඇත.

පසු ගිය ඇද වැටීමෙන් පසුව, එක්සත් ප්‍රගතිශීලී සන්ධාන ආන්ඩුව වාම පෙරමුනේ පීඩනයට පමනට වඩා නතු වන බවටත් වැඩි දුර පෞද්ගලීකරනයන්ට, සේවා අත්හිටුවීම් හා කම්හල් වැඩ බිම්වලට ඇති බාධාවන් ඉවත් කිරීමට හා සීමා ඉවත් කිරීම්වලට එරෙහි මහජන විරෝධතාවන් මධ්‍යයේ ඒවා පමා කරන බවටත් ඉන්දීය සංගත ප්‍රභූව සෝෂාකාරීව කල පැමිනිලි නිසැකව ම පැවතුනි.

එහෙත් අගමැති මන්මෝහන් සිං ද මුදල් ඇමති පී. චිදම්බරම් ද වහ වහා ප්‍රතිචාර දක්වමින් ප්‍රතිව්‍යුහකරනයන්ගේ වේගය වැඩි කරන බවට පොරොන්දු වූහ - කම්කරු පන්තියේ හා ගොවීන්ගේ නොසන්සුන්කම අනුකම්පා විරහිතව වර්ධනය කරමින් ප්‍රාග්ධනයට අභිමතව ක්‍රියා කිරීමේ බලය ලබා දී ඇති චීනයෙහි ''අනුකම්පා රහිත'' බවට නැකම් දක්වන අයුරින් එක්සත් ප්‍රගතිශීලී සන්ධානය ක්‍රියා කරනු ඇතැයි චිදම්බරම් කැපී පෙනෙන අයුරින් පොරොන්දු විය.

වඩා වැඩි ඍජු විදේශ ආයෝජනවලට (එෆ්ඩීඅයි) සිල්ලර වෙලඳ අංශය විවෘත කරන බවට නිවේදනය කල ආන්ඩුව, අවසානයේ දී වෘත්තීය සමිති විසින් මර්දනය කරනු ලැබූ සටන්කාමී වර්ජනයක් මධ්‍යයේ ගුවන් තොටුපොල පෞද්ගලීකරන සැලැස්ම ඉදිරියට දැමීම වඩා වැදගත් වේ.

එක්සත් ප්‍රගතිශීලී සන්ධානය න්‍යෂ්ටික ගිවිසුමක් පිලිබඳව බුෂ් පරිපාලනය සමග කල සාකච්ඡාවලින් ඉන්දියානු පාලක ප්‍රභූවේ සිත් ඇලලී ගියේ ආන්ඩුවේ වාම පෙරමුනු සහායකයන්ගේ විරෝධතාවල දී වූවාට වඩා අඩුවෙන් නො වේ. මෙම ඉන්දියානු-එක්සත් ජනපද න්‍යෂ්ටික ගිවිසුම ඉන්දියාවට න්‍යෂ්ටික අවි සහිත රාජ්‍යයක් ලෙස තථ්‍ය පිලිගැනීමක් ලබා දෙන්නා වූ ද වොෂින්ටනය සමග සමීප සබඳතාවක පොරොන්දුවක් සහතික කරන්නා වූ ද තතු තුල සංගත ප්‍රභූව එය දකින්නේ ලෝක බලයක් ලෙස ඉස්මතු වීමට ඉන්දියාවට පවතින අපේක්ෂාව ඉටු කර ගැනීමේ දිගු ගමනේ බලගතු ඉදිරි පියවරක් ලෙස ය.

වෙනස් කොන්දේසි යටතේ - එනම් සංගත ප්‍රභූව කොන්ග්‍රස්-නීත එක්සත් ප්‍රගතිශීලී සන්ධානය සමග

විරසක වූ කොන්දේසි තුල - මෙම මාධ්‍ය විසින් සෝනියා ගාන්ධිගේ ලාභප්‍රයෝජන-සඳහා-නිලතල ලබා ගැනීම පිලිබඳ සිද්ධිය වෙනත් ආකාරයකට කරකවනු ලැබෙතැයි කෙනෙකුට නිසැකයෙන් ම සිතා ගත හැකි ය.

එවැනි තත්ත්වයක් යටතේ, කොන්ග්‍රසයේ සභාපතිනිය හා පාර්ලිමේන්තු කන්ඩායමේ නායිකාව ව්‍යවස්ථානුකූල නීතියක් උල්ලංඝනය කරමින් සිටී ය යන කරුන අපචාරයක් ලෙස හැඳින්වෙනු ඇති අතර, සමාජවාදී පක්ෂයට එරෙහිව ලාභප්‍රයෝජන-සඳහා-නිලතල ලබා ගැනීම පිලිබඳ කරුන අදක්ෂ ලෙස භාවිත කිරීම ගාන්ධිගේ දුර්වල විනිශ්චයක් ලෙස පෙන්නුම් කෙරෙනු ඇත.

කරුනු වෙනස් වුව ද, මේ සඳහා යමෙකු කල යුතු වන්නේ එවකට ඉන්දියානු විදේශ ඇමතිව සිටි නට්වාර් සිංගේ නම ඉරාකයේ ඊනියා ආහාර-සඳහා-තෙල් මගඩිය පිලිබඳ පෝල් වෝල්කර්ගේ අවසාන වාර්තාවේ උපග්‍රන්ථයක ඇතුලත්ව තිබූ විට මාධ්‍ය අවලාද නැගුවේ කෙසේ දැයි යලි සිහිපත් කර ගැනීම පමනි. සිංගේ කිසිදු වරදක් පිලිබඳව වෝල්කර් සාක්ෂ්‍ය සම්පාදනය නො කල අතර, ප්‍රන්සය හා රුසියාව ඇතුලු අනෙකුත් රටවල් තම විරුද්ධවාදීන්ට අවනම්බු කිරීම සඳහා එක්සත් ජනපදයේ රිපබ්ලිකානු දක්ෂිනාංශය දැරූ තැතක් ලෙස වෝල්කර්ගේ වාර්තාව නො තකා හලේ ය. එහෙත් ඉරාක යුද්ධයට ද අනෙකුත් ද්විපාර්ශ්වික සබඳතාවලට ඉහලින් ඉන්දු-එක්සත් ජනපද සබඳතා වරප්‍රසාදිත කිරීමට ද එරෙහි වීම පිලිබඳව නම් දැරූ අයෙකු ආන්ඩුවෙන් නෙරපා හැරීම සඳහා අවස්ථාවක් ලෙස මාධ්‍ය හා කොන්ග්‍රසය තුල සිංගේ විරුද්ධවාදීහු වෝල්කර්ගේ වාර්තාවේ එල්ලී ගත්හ.

ඉන්දියානු ධනපති පන්තියේ සාම්ප්‍රදායික පාලක පක්ෂය වන කොන්ග්‍රසයේ නොනවතින පිරිහීම මත පතනය කරන ආලෝකය නිසා ද සෝනියා ගාන්ධිට මාධ්‍ය දක්වන ප්‍රශංසාව අර්ථභාරී වේ. කොතරම් අවිනිශ්චිත ආකාරයකට වුවත් බ්‍රිතාන්‍ය පාලනයට එරෙහි අරගලය සමග බද්ධ වී සිටි නිසා කොන්ග්‍රසය එක් කලෙක දී නිර්ව්‍යාජ මහජන පදනමකට හිමිකම් කී ය. අද වන විට එය, 1984 පටන් පාර්ලිමේන්තු බහුතරයක් දිනා ගැනීමට අසමත්ව ඇත්තා වූ ද බලයේ රැඳී සිටීම සඳහා පමනක් නො ව දුප්පත් මහජනතාවගේ තත්ත්වය පිලිබඳ තැකීමක් ඇති ප්‍රගතිශීලී පක්ෂයක් ය යන සිය කියා පෑම්වලට යම් හෝ ආකාරයක විශ්වාසයක් දිනා ගැනීම සඳහා වාම පෙරමුන මත රඳා සිටින්නා වූ ද දූෂිත හා පිම්බුනු සංවිධානයකි.

සමාජවාදී පක්ෂය සමග කොන්ග්‍රසය නිරතව සිටින කන්ඩායම්ක යුද්ධය කිසි සේත් අලුත් එකක් නො වේ. සීක් වාර්ගික දේශපාලනය ගසා කෑමට කල උත්සාහය ආපසු කැරකුනු විට ඉන්දිරා ගාන්ධි ඝාතනයට ලක් විය. නමුත් රටෙහි විශාල ප්‍රදේශයක සැලකිය යුතු සහයෝගයක් නැති අද දින, ඡන්ද දිනා ගැනීමටත් ආන්ඩු බිහි කිරීමටත් - මහා රාෂ්ටයේ හිටපු ශිව් සේනා මහ ඇමති නාරායන් රානි මෑත දී කොන්ග්‍රසයට ඇතුලත් කර ගැනීම හෝ ජනාධිපති බලතල භාවිත කරමින් ප්‍රතිමල්ලව සභාගයක් බිහාරයේ බලයට ඒම වැලැක්වීමට ක්‍රියා කිරීම හෝ වේවා - කොන්ග්‍රසය වෙන කවර දාට වත් වඩා මාධ්‍ය උපාමාරු දැමීම් හා ප්‍රතිගාමී ආයාචන මත පදනම් වෙයි.

තව ද, තම මස්සිනා වූ සන්ජේ ගාන්ධිගේ මරනය ද තම සැමියා වූ රජීව් ගාන්ධිගේ ඝාතනය ද නිසා කොන්ග්‍රසයේ සුපිරි සංවිධානාත්මක කටයුතු තීරකවරිය වී සිටින සෝනියා ගාන්ධි නම් වූ මුලුමනින් ම අභව්‍ය චරිතය පක්ෂය මුදුනේ සිටී. ඒ අතර ම, කොන්ග්‍රස් නායකයන් සෝනියා ගාන්ධිගේ ප්‍රඥාවට හා චරිතයට නමස්කාර කල යුතු ය. ඒ අනුව, අගමැති මන්මෝහන් සිං කියා සිටියේ ගාන්ධිගේ මෑත ඉල්ලා අස් වීම ඇය ඉන්දියාවේ "ඉහලම නායිකාව" හා "සදාචාර වටිනාකම් පිලිබඳව කලා තුරකින් දක්නට ලැබෙන වර්ගයේ පේ වීමක්" ඇති අයෙකු බව නැවත වතාවක් පෙන්නුම් කර ඇති බව යි. මෙම පාලියට - අඩු ම තරමින් සංගත ප්‍රභුව තම නව-ලිබරල් න්‍යාය පත්‍රය ක්‍රියාවට දැමීමෙහි ලා හොඳ ම වාහකය එක්සත් ප්‍රගතිශීලී සන්ධානය යැයි ගනන් බලන තාක් කල් - මාධ්‍ය ද එකතු වෙයි.

© www.wsws.org